## (Does the theological dialogue of the Lutheran Reforms pose an impediment to Ecumenism among the Churches?)

### ලූතරානු ප්‍රතිසංස්කරණයේ දේවධාර්මික සංවාදය කිතුනු සභා සාමයිකත්වයට බාධාවක් ද?


මහේෂ් ශ්‍රී ජයම්පති හේමචන්ද්‍ර*

dokrevmh@yahoo.com



**සංක්ෂේපය**

ලූතරානු ප්‍රතිසංස්කරණ නවෝදය පාප්වරයේ ආධිපත්‍යට විරෝධය පෑමක් ලෙසත් දේශපාලන වුවමනා සම්පූර්ණ කර ගැනීමට කරන ලද උත්සාහයක් හා වෙනත් සභාවක් ආරම්භ කරන්නට කරන ලද අරගලයක් ලෙස විවිධ අයුරින් නිර්වචනය කළ හැක. මෙම පත්‍රිකාවේ අරමුණ වනුයේ ලූතරානු ප්‍රතිසංස්කරණය මගින් හඳුන්වාදෙනු ලැබූ දේවධාර්මික සංවාදය ශ්‍රී ලංකීය කිතුනු සභා සාමයිකත්වයට බාධාවක්ද? යන්න විසඳීමයි. බටහිර කිතුනු සභාවේ බැතිමතෙකු ලෙස මාර්ටින් ලූතර් ඉදිරිපත් කළ ඉගැන්වීම් සම්පිණ්ඩනයක් ලෙස බලන විට ලූතර්ගේ දේවධර්මයේ මූලික ලක්ෂණ වලින් දේවධර්මයේ නවතාවයක් ඉස්මතුවේ.

**දේවධර්මයේ මූලික ලක්ෂණ**

- ක්‍රිස්තුස් වහන්සේ පමණක්
- ඇදහිල්ල පමණක්
- ශුද්ධ ලියවිලි පමණක්

**දේවධර්මයේ නවතාවයන්**

- දෙවියන් වහන්සේ පිළිබඳ නව අවබෝධයක්
- සභාව පිළිබඳව අවබෝධයක්
- මිනිස් සංහතිය පිළිබඳ නව අවබෝධයක්
- සක්‍රමේන්තු පිළිබඳව නව අවබෝධයක්

ලූතර්ගේ ඉගැන්වීම් රෝමානු කතෝලික මුල් සභාව සමග සංවාදයට බඳුන් වීමත් සමග ඇති වූ දේශපාලනිකත්වය, ජාතිකත්වය හා වෙනත් නිකායන් බිහිවන්නට පාදක වූ ආකාරය පිළිබඳ විමර්ශනයක් කරන්නට ද පර්යේෂණ පත්‍රිකාවෙන් බලාපොරොත්තු වෙමි.

ලූතරානු ප්‍රතිසංස්කරණය මගින් දේශපාලනිකත්වය, ජාතිකත්වය හා සභා භේදය බිහිවීමේ ප්‍රවණතා ඇතිවීට බලපෑ දේවධාර්මික සංවාදය ශ්‍රී ලාංකික කිතුනු සභා සාමයික සංවාදයකට මෙන්ම එහි ලක්ෂණ හා නවතාවයන් රුකුලක් වන්නේද යන්න විමර්ශන ක්‍රමවේදයන් ඔස්සේ විග්‍රහ කරන්නට අපේක්ෂා කරමි.



**මූලික පද:** ලූතරානු ප්‍රතිසංස්කරණය, නව දේවධර්මය, සාමයික සංවාදය, ලාංකේය කිතුනු සභා.


---


* දේවධර්මය පිළිබඳ උපාධිධාරියෙකු මෙන් ම උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි. කැලණිය විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති (M.A. (Kelaniya) උපාධිය හදාරයි.